**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

## අදියර I විභාගය - 2026 ජූලි

## (1603) ආර්ථික විද්‍යාව

(Economics)

---

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සඳහා උත්තර සැපයීමේදී බොහොමයක් විභාග අයදුම්කරුවන් ප්‍රමාණාත්මක මට්ටමින් උත්තර සපයා තිබූ බව පෙනේ. කෙසේවෙතත්, සමස්තයක් වශයෙන් ගත් කළ ඇතැම් ප්‍රශ්න සඳහා බොහොමයක් අයදුම්කරුවන් සපයා තිබූ උත්තරවල යම් යම් අඩුපාඩුකම් දක්නට ලැබුණි.

ඒ අනුව උත්තරපත් පරීක්ෂා කිරීමේදී ඒ පිළිබඳව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ:

## A කොටස

### ප්‍රශ්න අංක 01

ආර්ථික විද්‍යා විෂය නිර්දේශයෙහි පුළුල් පරාසයක් ආවරණය වන පරිදි මෙම කොටස සකස්කර ඇත. මූලික ආර්ථික විද්‍යාත්මක න්‍යායන් සහ සංකල්ප පදනම් කරගනිමින් සැකසූ වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න ඇතුලත් මෙම ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි.

ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා බහුවරණ ප්‍රශ්න දහයකින් සමන්විත වේ.

ප්‍රශ්න අංක **1.11** සිට **1.12** දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි උත්තර ලිවීමට තිබූ අතර, ප්‍රශ්න අංක **1.13** සිට **1.14** දක්වා ප්‍රශ්න වලට ඇති එක් ප්‍රකාශයන් සත්‍ය හෝ අසත්‍ය යන්න ප්‍රකාශ කිරීම සහ ප්‍රශ්න අංක **1.15** සිට **1.20** දක්වා ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංකයද සමග පිළිතුරු පොතේ ලිවීමත් මෙම කොටස මගින් අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රශ්ණය යටතේ බොහොමයක් අයදුම්කරුවන් සාර්ථක ලෙස ලකුණු ලබාගෙන තිබුණු අතර, ඇතැම් අයදුම්කරුවන්ගේ උත්තරවල දුර්වලතා දක්නට ලැබුණි. මේ අනුව පොදුවේ දැකිය හැකි දුර්වලතා පහත පරිදි වේ:

**1.11** ඒකාධිකාරී තරග වෙළඳපොළක දිගු කාලයේ දී ලබන ලාභය පිළිබඳව අයදුම්කරුවන් බොහෝ දෙනෙකුගේම පවතින අවබෝධය මඳ බව පෙනේ. "ප්‍රමාණික / ශුන්‍ය" ලෙස නිවැරදිව දක්වා තිබූ අයදුම්කරුවන් ලකුණු ලබාගැනීමට සමත්ව තිබුණි.

**1.12** යෙදවුම සහ නිමැවුමේ සමානුපාතිකය වැඩිවීම පිළිබඳව අසා තිබූ ප්‍රශ්නය අයදුම්කරුවන් පැහැදිලිව අවබෝධ කරගෙන නොතිබුණි.

**1.13** මහ බැංකුවේ ප්‍රමාණාත්මක හා ගුණාත්ම උපකරණ පිළිබඳ දැනුම සමහර අයදුම්කරුවන් මාරු කර කරුණු අවබෝධ කරගෙන තිබුණි. නිවැරදිව අවබෝධ කරගත් අයදුම්කරුවන් දී ඇති කරුණ "අසත්‍ය" ලෙස සඳහන් කර තිබුණි.

**1.14** කෙටිකාලීන පිරිවැය පිළිබඳව අසා තිබූ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සත්‍ය ලෙස පිළිතුරු සපයා තිබුණි.

**1.15** "ආවස්ථික පිරිවැය" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද පිළිබඳව අසා තිබුණු මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සාර්ථක ලෙස උත්තර ලියා තිබුණි.

**1.16** ඉල්ලුම් නීතියට හේතු ලෙස අසා තිබූ ආදේශන ප්‍රතිවිපාකය පිළිබඳව අයදුම්කරුවන් බහුතරයක්ම සාර්ථකව පිළිතුරු සපයා නොතිබුණි

**1.17** අයදුම්කරුවන් බහුතරයක් ආර්ථික වර්ධනය තීරණය කරන සාධක වන සාධක හිමිකාරිත්වය, ඵලදායීතාවය, ආර්ථික ස්ථාවරත්වය, දේශපාලන ස්ථාවරත්වය යනාදිය නිවැරදිව සඳහන් කර නොතිබුණි.

**1.18** අවශ්‍යතා සහ වුවමනා අතර වෙනස්කම් සඳහන් කිරීමට අසා තිබූ ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

**1.19** ඉල්ලුම් වක්‍රය වමට විතැන් කිරීමට හේතුවන සාධක වෙනුවට බොහොමයක් අයදුම්කරුවන් වැරදි සහගත ලෙස සැපයුම් වක්‍රය වමට විතැන් කිරීමට බලපාන සාධක ඉදිරිපත් කර තිබුණි.

**1.20** ආර්ථක සංවර්ධනය පිළිබඳ සිසුන්ගේ දැනුම මද බව පෙනේ. සමහර අයදුම්කරුවන් ආර්ථික සංවර්ධනය වෙනුවට ආර්ථක වර්ධනය පිළිබඳව පිළිතුරු සපයා තිබුණි. සමහර අයදුම්කරුවන් වර්ධනය සහ සංවර්ධනය පටලවාගෙන පිළිතුරු සපයා තිබුණි. නිවැරදිව උත්තර ලියූ අයදුම්කරුවන් ආර්ථික සංවර්ධනය යනු ආර්ථික වර්ධනයේ පරිණාමීය ක්‍රියාවලියක් බව හඳුන්වා දී තිබුණි.

## <u>B කොටස</u>

(එක් කොටසකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.)

### ප්‍රශ්න අංක 02

**(a)** බොහොමයක් අයදුම්කරුවන් ආර්ථික භාණ්ඩවල ලක්ෂණ ලෙස සැපයුමේ හිඟකමක් පැවතීම, සම්පත් පිරිවැයක් පැවතීම, ආවස්ථික පිරිවැයක් පැවතීම යනාදිය නිවැරදිව උත්තර ලෙස සඳහන් කර තිබුණි.

**(b)** ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න 3 බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව සඳහන් කර තිබුනද, සමහර අයදුම්කරුවන් කුමක් කවර ප්‍රමාණයකින් නිපදවන්නේද යන් කොටස් දෙකෙන් එක් කොටසක් පමණක් ඉදිරිපත් කර තිබුණි.

**(c)** පූර්ණ තරගකාරී ආයතනයක් කෙටි කාලයකදි ලාභ උපරිම කිරීම ප්‍රස්තාර භාවිතයෙන් ඉදිරිපත් කිරීම අසාර්ථක ලෙස ඉදිරිපත් කර තිබුණි. ලාභ උපරිම කිරීම MR = MC ක්‍රමය හෝ TR = TC ක්‍රමවේද පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවේ.

ප්‍රස්තාරය ඉදිරිපත් කිරීම බොහොමයක් අයදුම්කරුවන් අසාර්ථක වී තිබුණි. ප්‍රස්තාරය ඉදිරිපත් කළ අයදුම්කරුවන් සිටියද ඔවුන් එය පැහැදිලි කිරීමට අපොහොසත්ව තිබුණි.

## ප්‍රශ්න අංක 03

**(a)** සැපයුම් නීතිය යන්න යම් කාලසීමාවක් තුළ, අදාල භාණ්ඩයේ මිල හැර, සැපයුම තීරණය කරන සියළුම සාධක නොවෙනස්ව පවතින විට, අදාල භාණ්ඩයේ මිල සහ එම භාණ්ඩයේ සැපයම අතර පවතින අනුලෝම සම්බන්ධතාවය සැපයුම් නීතිය ලෙස බොහොමයක් සිසුන් නිවැරදිව අර්ථදක්වා ඇතත්, සමහර සිසුන් නිශ්චිත අවස්ථාවදී යන්න සැපයුම් නීතිය හැඳින්වීමේදී අමතක කර ඇත.

**(b)** බොහොමයක් සිසුන් දී තිබූ ශ්‍රිතයන් දෙක භාවිතයෙන් භාණ්ඩයේ සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය නිවැරදිව ගණනය කර තිබුණි.

**(c)** රජය විසින් භාණ්ඩයක් සඳහා උපරිම මිලක් පැනවීමේ ප්‍රතිවිපාක සඳහා සාර්ථක පිළිතුරු සපයා නොමැත. උපරිම මිල සඳහා රූපසටහනද, අසාර්ථක ලෙස ඉදිරිපත් කර ඇත. සමහර අයදුම්කරුවන් උපරිම මිල වෙනුවට අසාර්ථක ලෙස අවම මිලෙහි ප්‍රතිපල ලෙස පිළිතුරු සපයා තිබුණි.

## ප්‍රශ්න අංක 04

**(a)** බොහොමයක් අයදුම්කරුවන් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් 3 ක් සාර්ථකව ඉදිරිපත් කර තිබුණි.

**(b)** අයදුම්කරුවන්ගෙන් බහුතරයක්ම මුදලට ඇති ඉල්ලුම තීරණය කරනු ලබන සාධක ලෙස ගනුදෙනු චේතනාව, ආරක්ෂණ චේතනාව සහ සමපේක්ෂණ චේතනාව ලෙස සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

**(c)** සමහර අයදුම්කරුවන් උද්ධමනයට හේතු ලෙස ඉල්ලුමෙන් ඇදුනු උද්දමනය හා පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය ලෙස සඳහන් කර නිවැරදිව පැහැදිලි කර තිබුණි.

අයදුම්කරුවන්ගෙන් කිහිප දෙනෙකු උද්දමනය ඇති වීමට හේතු වෙනුවට උද්දමනයේ ප්‍රතිවිපාක වැරදි පිළිතුරු ලෙස සපයා තිබුණි. තවත් සමහර අයදුම්කරුවන් අදාල කරුණු සඳහන් කර තිබුණද, ඒවා විස්තර නොකිරීම හේතුවෙන් අදාල ප්‍රශ්නයට වෙන් කර තිබූ මුළු ලකුණු ප්‍රමාණය ලබාගැනීමට අසමත්ව තිබුණි.

## ප්‍රශ්න අංක 05

**(a)** අන්තර්ජාතික වෙළඳාමේ වාසි 03ක් අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. ඔවුන්ගේ සාමාන්‍ය දැනුම භාවිතයෙන් මෙන්ම, ස්ව-අධ්‍යයන පොත භාවිතයෙන්ද පිළිතුරු ලිවිය හැකි පහසු ප්‍රශ්නයකි.

**(b)** ගෙවුම් ශේෂ ලේඛණයේ වාර්තා කරනු ලබන ගනුදෙනු වර්ග පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම වර්ධනය කරගත යුතුය. භාණ්ඩවල වෙළෙඳ ශේෂය, සේවාවල වෙළෙඳ ශේෂය, ශුද්ධ ආවස්ථික අගය, බැංකු ප්‍රවාහයේ ශේෂය යනාද නිවැරදි පිළිතුරු සැපයූ අයදුම්කරුවන් මේ සඳහා ලකුණු ලබාගෙන තිබුණි.

**(c)** මැදපෙරදිග යුද්ධය පිළිබඳව ගෝලීය ආර්ථිකයට බලපාන ආකාරය පිළිබඳව අයදුම්කරුවන් සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණි.

## C කොටස

### ප්‍රශ්න අංක 06

**(A)** වියදම් ප්‍රවේශය භාවිතයෙන් වෙළඳ පොළ මිලටඃ

(a) දළ දේශීය වියදම

(b) දළ දේශීය නිෂ්පාදනය

(C) දළ ජාතික ආදායම බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව ගණනය කර සම්පූර්ණ ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත්ව තිබුණි.

**(B)** බොහොමයක් අයදුම්කරුවන් ව්‍යාපාර චක්‍රයේ අවධි 4 වන මුදුන, සංකෝචනය, පතුළ සහ ප්‍රසාරණය නිවැරදිව ලැයිස්තුගත කර තිබුණි.

**(C)** ජාතික ගිණුම්වල පවතින සීමාවන්, සමහර අයදුම්කරුවන් සාර්ථකව ලියා තිබුණද, සමහර අයදුම්කරුවන් අවබෝධයකින් තොරව පිළිතුරු සපයා ඇති බව පෙනේ. ස්ව-අධ්‍යයන පොත හොඳින් අධ්‍යයනය කළ අයදුම්කරුවන්ට මෙය ඉතා සරල ප්‍රශ්නයක් විය.

**(D)** අයදුම්කරුවන්ට රටක පිස්කල් ප්‍රතිපත්තිය පිළිබඳ පවතින දැනුම අඩු බවක් පෙන්නුම් කර ඇති අතර, මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සපයා නොතිබුණි.

**(E)** වෙළඳපොළ ආර්ථිකයක රජයේ කාර්යයන් 2 පැහැදිලිව සඳහන් කර තිබුණි. එසේ සඳහන් කළ පිළිතුරු අතර, සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීම, ආදායම හා ධනය සාධාරණව බෙදා හැරීම, සාර්ව ආර්ථික ස්ථාවරත්වය ඇති කිරීම, ආදිය විය.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලියන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත් ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

- *** -